# මාධ්‍ය නිවේදනය



2019 මාර්තු 08 වන දින ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ දී ගත් ඡායාරූපයකි.

## ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2019

ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව නිම කළ ගුරුභවතුන් සඳහා ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය මෙවර ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අධ්‍යාපන අමාත්‍ය නීතිඥ අකිල විරාජ් කාරියවසම් මැතිතුමා හා ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය විජයකලා මහේෂ්වරන් මැතිණියගේ සහභාගිත්වයෙන් 2019.05.22 දින අරලියගහ මන්දිරයේ දී පැවැත් වේ.

ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කරන ලද 2012-2014, 2013-2015 හා 2014-2016 යන කණ්ඩයම්වලට අයත් විද්‍යා පීඨ පහක ශික්ෂණලාභීන් 2365 ක් සඳහා අග්‍රාමාත්‍යතුමන් විසින් ඩිප්ලෝමා ප්‍රදානය කිරීමට නියමිත ය.

ඌව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ 336
පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ 264
නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ 667
රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ 555
රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ 546 දෙනෙකුට මෙහි දී ඩිප්ලෝමා ලබා ගැනීමට නියමිත ය.

ඉදිරියේ දී ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, යාපනය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය හා වවුනියා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල ශික්ෂණලාභීන් 2478 දෙනෙක් සඳහා ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමා ප්‍රදානය කිරීමට නියමිත ය.

ඒ අනුව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය නියෝජනය කරමින් ශික්ෂණලාභීන් 10121 දෙනෙකු ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් බවට පත් වේ.

අරලියගහ මන්දිරයේ දී 2019.03.08 දින විද්‍යා පීඨ හතරක ශික්ෂණලාභීන් 2133 සඳහා ද ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සිදු කරන ලදී. ඒ වයඹ අධ්‍යාපන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මහරගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය හා දර්ගානගර් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ශික්ෂණලාභීන් සඳහා ය.

එමෙන් ම, සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, නිට්ටඹුව සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය හා හාපිටිගම විද්‍යා පීඨවල ශික්ෂණලාභීන් 1495 ද, අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ශික්ෂණලාභීන් 1075 ක් ඇතුළු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 6 ක ශික්ෂණලාභීන් 3129 ක් සඳහා සඳහා ද පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ශික්ෂණලාභීන් 559 සඳහා ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම මීට ප්‍රථමයෙන් අවසන් කර ඇත.

මෙම ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය හා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ මගින් සංවිධානය කරනු ලබයි.

*ජාතික අධ්‍යාපන ආයතනය*